# ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අයදුම්පත් කැඳවීම - 2016

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 2017-01-16 දින දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| **1.** | **පුස්තකාලයාධිපති** | **-** | **III ශ්‍රේණිය** |
| **2.** | **කාර්මික ගුරු** | **-** | **III ශ්‍රේණිය** |
| **3.** | **කාර්මික නිලධාරී (සිවිල්)** | **-** | **පුහුණු කිරීමේ ශ්‍රේණිය / III ශ්‍රේණිය** |
| **4.** | **කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක)** | **-** | **පුහුණු කිරීමේ ශ්‍රේණිය / III ශ්‍රේණිය** |
| **5.** | **සත්ව සංවර්ධන උපදේශක** | **-** | **පුහුණු කිරීමේ ශ්‍රේණිය / III ශ්‍රේණිය** |
| **6.** | **කෘෂිකර්ම උපදේශක** | **-** | **III ශ්‍රේණිය** |

**02. බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :**

(අ) අයදුම්කරු/ අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඇ) 1. පුස්තකාලයාධිපති/ කාර්මික ගුරු/ කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) තනතුරු :

- ඌව පලාතේ අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් කැඳවන අවසාන දිනට ඌව පලාත තුළ අවම වශයෙන් පූර්වාසන්න වසර 03ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතු අතර, ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද නියමිත ආකෘතිය මගින් පදිංචිය සනාථ කළ යුතුය.

2. කාර්මික නිලධාරී (සිවිල්), කෘෂිකර්ම උපදේශක හා සත්ව සංවර්ධන උපදේශක තනතුරු :

- දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචි සුදුසුකම් සහිත අයදුම්කරුන්ට කාර්මික නිලධාරී (සිවිල්), කෘෂිකර්ම උපදේශක හා සත්ව සංවර්ධන උපදේශක තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වේ.
- මෙහිදී ඌව පලාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. ඔවුන් වෙත පත්වීම් ලබා දීමෙන් අනතුරුව තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම් අනෙකුත් පළාත් අයදුම්කරුවන් සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

(ඈ) සෑම අයදුම්කරුවෙකුම තමා අයදුම්කරන තනතුරට අදාළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ වයස අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන 2017-01-16 දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

(අ) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හි විධි විධාන ප්‍රකාරව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(ඇ) බඳවා ගන්නා නිලධාරීන් ඌව පලාත තුළ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ඈ) තෝරාගනු ලබන්නන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහයටද, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයටද, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහයට හා මුදල් රීති සංග්‍රහයටද, මුදල් රෙගුලාසිවලටද, රජයේ සහ පළාත් සභා රාජ්‍ය සේවයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළ වරින් වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද යටත් විය යුතුය.

**04. වැටුප් පරිමාණය :**

| තනතුර | රා.ප.ච. 03/2016 හි උපලේඛන I අනුව වැටුප් පරිමාණය |
|---|---|
| පුස්තකාලයාධිපති - III ශ්‍රේණිය | MN 3-2016- රු. 31,040-10x445-11x660-10x730-10x750-57,550* |
| කාර්මික නිලධාරී (සිවිල්)/ කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක)/ කෘෂිකර්ම උපදේශක සහ සත්ව සංවර්ධන උපදේශක - III ශ්‍රේණිය | MN 3-2016- රු. 31,040-10x445-11x660-10x730-10x750-57,550* |
| කාර්මික නිලධාරී (සිවිල්), කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) හා සත්ව සංවර්ධන උපදේශක - පුහුණු ශ්‍රේණිය | රා.ප.ච. 03/2016 හි උපලේඛන අංක V අනුව මාසික දීමනා සහ ගැලපුම් දීමනා ගෙවනු ලැබේ. |
| කාර්මික ගුරු | MN 1-2016- රු. 27,140-10x300-11x350-10x495-10x660-44,540* |

* රා.ප.ච. 03/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ.

**05. එක් එක් තනතුරට අදාළ වයස් සීමාව, අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම් :**

**(I) වයස :**

- ➢ පුස්තකාලයාධිපති : අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)
- ➢ කාර්මික ගුරු : අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
- ➢ කාර්මික නිලධාරී (සිවිල්)/ කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක)/ කෘෂිකර්ම උපදේශක හා සත්ව සංවර්ධන උපදේශක තනතුරු : අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**(II) අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :**

| අනු අංකය | තනතුර | බඳවා ගන්නා ශ්‍රේණිය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | පුස්තකාලයාධිපති | III ශ්‍රේණිය | සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි හා ගණිතය විෂයන් ඇතුළත්ව එක්වරකදී විෂයන් හය (06) ක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථයන් හතර (04) ක් සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබීම<br>සහ<br>අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම. | පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ උපාධිය හෝ තුන් (03) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී තිබීම<br>හෝ<br>ශ්‍රී ලංකා පුස්තකාල සේවා සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් (03) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්වී තිබීම. |
| 02 | කාර්මික ගුරු | III ශ්‍රේණිය | සිංහල / දෙමළ/ ඉංග්‍රීසි, ගණිතය ඇතුළුව තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් අ.පො.ස. (සා./පෙළ) විභාගය සමත් වී තිබීම<br>සහ<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් එක් විෂයක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | රජයේ පිළිගත් ලුහු ඉංජිනේරු ආයතනයක එක් අවුරුදු පාඨමාලාව හෝ ඊට වැඩි කාලයක් පුහුණු පාඨමාලාව හදරා අවසාන සහතික පත්‍රය ලබා තිබීම. |
| 03 | කෘෂිකර්ම උපදේශක | III ශ්‍රේණිය | ක්ෂේත්‍රයට අදාළ විෂයන් දෙකක් සහිතව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයන් තුනකින් අ.පො.ස. (උ/පෙ) විභාගය එකවර සමත් වීම<br>සහ<br>සිංහල/ දෙමළ/ ඉංග්‍රී භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව අ.පො.ස (සා/පෙළ) විභාගය එකවර විෂයන් හයකින් (06) කින් සමත්වීම. | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව ලබා තිබීම<br>හෝ<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ තාක්ෂණ ඩිප්ලෝමාව<br>හෝ<br>රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| 04 | සත්ව සංවර්ධන උපදේශක | පුහුණු කිරීමේ ශ්‍රේණිය | විද්‍යා/ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයන් දෙකකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත් වීම<br>සහ<br>සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගය එකවර විෂයන් හයකින් (06) කින් සමත්වීම. | වැලිසර, සීප්පුකුලම, කුණ්ඩසාලේ යන ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාල මගින් ලබා ගත් දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. |
| | සත්ව සංවර්ධන උපදේශක | III ශ්‍රේණිය | ක්ෂේත්‍රයට අදාළ විෂයන් දෙකක් ඇතුළත්ව විද්‍යා / ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයන් තුනකින් අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර සමත් වීම<br>සහ<br>සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගය එකවර විෂයන් හයකින් (06) කින් සමත්වීම. | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු සත්ව පාලන ඩිප්ලෝමාව හෝ දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව ලබා තිබීම<br>හෝ<br>රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| 05 | කාර්මික නිලධාරී (සිවිල්) | පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් අවුරුදු) | ක්ෂේත්‍රයට අදාළ විෂයන් දෙකක් ඇතුළත්ව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයන් තුනකින් අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර සමත් වීම<br>සහ<br>සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගය එකවර විෂයන් හයකින් (06) කින් සමත්වීම. | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක ජාතික තාක්ෂණික සහතිකය (සිවිල්) පාඨමාලාව හදරා සහතිකය ලබා තිබීම<br>හෝ<br>තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| | | III ශ්‍රේණිය | -එම- | මොරටුව විශ්වවිද්‍යාලයෙන් හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව<br>හෝ<br>අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව<br>හෝ<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම<br>හෝ<br>රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| 06 | කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) | පුහුණු ශ්‍රේණිය (එක් අවුරුදු) | භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව ඇතුළත්ව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත් වීම<br>සහ<br>සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව අ.පො.ස (සා/පෙළ) විභාගය එකවර විෂයන් හයකින් (06) කින් සමත්වීම. | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක ජාතික තාක්ෂණික සහතිකය (ප්‍රමාණ සමීක්ෂක) පාඨමාලාව හදරා සහතිකය ලබා තිබීම<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| | | III ශ්‍රේණිය | -එම- | මොරටුව විශ්වවිද්‍යාලයෙන් හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව<br>හෝ<br>අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව<br>හෝ<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

## 06. බඳවා ගැනීමේ ක්‍රමය :

1. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි විධිමත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇති විට ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු විධිමත් අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇත්නම් තරග විභාගයක් නොපවත්වන අතර, සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2. තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු අදාල තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

3. තරග විභාගය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකය මගින් පවත්වනු ලැබේ. තරග විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4. ඉහත එක් එක් තනතුරු සඳහා තරග විභාගයේ විෂය නිර්දේශය 10 ඡේදයේ දක්වා ඇත. විභාගයෙන් සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබාගත යුතු අවම ලකුණු සංඛ්‍යාව 40% කි.

5. විභාග දිනයේදී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත්කළ වලංගු ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

## 07. අයදුම් කළ යුතු පිළිවෙල :

1. මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රයේ ඒ ඒ ශීර්ෂයන් පැහැදිළිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. අංක 01 සිට 04 දක්වා කොටස් පළමු පිටුවටද අංක 05 සිට ඉදිරියට වන කොටස් දෙවන හා තෙවන පිටුවලටද ඇතුළත් වනසේ අයදුම්පත්‍රය සැකසිය යුතු අතර, අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂය දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

2. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2017-01-16 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ **"ලේකම්, ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පිළිපොතගම පාර, පිංඅරාව, බදුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම්කරන තනතුර පැහැදිළිව සටහන් කළ යුතුය.

3. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරන ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

4. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, ප්‍රමාද වී ලැබෙන, අඩුපාඩු සහිත හා අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍ර තැපෑලේදී නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

## 08. අත්සන සහතික කිරීම :

අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු/ පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු/ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ රු. 240,360/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

## 09. විභාග හා පරිපාලන වියදම් :

විභාග ගාස්තු හා පරිපාලන ගාස්තු රු. 600/- කි. අදාළ විභාග ගාස්තු ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට අලවා එවිය යුතුය.

කාර්මික නිලධාරී (සිවිල්)/ කෘෂිකර්ම උපදේශක සහ සත්ව සංවර්ධන උපදේශක තනතුරුවලට අයදුම්පත් ඉදිරිපත් කරන පිට පළාත් අයදුම්කරුවන්ට පමණක් අදාල විභාග ගාස්තු දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකුවකට "ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ගිණුම් අංක 269-1-001-7-8440329 ට බැර කර ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවීමට පුළුවන.

ලදුපතේ මුල් පිටපත අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඉහත සඳහන් ආයතනවලට හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

## 10. තරග විභාග හා ඊට අදාළ විෂය නිර්දේශ සම්බන්ධ තොරතුරු :

**1. පුස්තකාලයාධිපති තනතුර : තරග විභාගය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ.**

1. පුස්තකාල විද්‍යාව - පැය 03 - ලකුණු 100
2. බුද්ධි පරීක්ෂණය - පැය 01 - ලකුණු 100
3. සාමාන්‍ය දැනීම - පැය 01 - ලකුණු 100

* විස්තරාත්මක විෂය නිර්දේශය සඳහා : **www.psc.up.gov.lk** වෙබ් අඩවිය බලන්න.

**2. කාර්මික ගුරු තනතුර : විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.**

1. අභියෝග්‍යතාවය - පැය 01 - ලකුණු 100

   අපේක්ෂකයාගේ භාෂාමය හැකියාව හා සංඛ්‍යාමය හැකියාව මැන බැලීම සඳහා පවත්වන පරීක්ෂණයකි.

2. සාමාන්‍ය දැනීම - පැය 01 - ලකුණු 100

   මෙම ප්‍රශ්න පත්‍රය සමාජීය, ආර්ථික, දේශපාලන තොරතුරු ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

**3. කාර්මික නිලධාරී (සිවිල්), කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක), සත්ව සංවර්ධන උපදේශක හා කෘෂිකර්ම උපදේශක තනතුරු :**

විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය - පැය 01 - ලකුණු 100

   මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ භාෂාමය කුසලතාවය, සංඛ්‍යාමය හැකියාව, තර්කාණුකූල ශක්තිය, විශ්ලේෂණ සංස්ලේෂණ හැකියාව, ඉක්මණින් නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ආදිය මැන බැලීම සඳහා සකස් කළ බහුවරණ හා ව්‍යුහගත රචනා ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය - ලකුණු 100

## 11. සාවද්‍ය තොරතුරු සැපයීම :

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු/ ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**12.** මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම/ නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම්/ තීරණය කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදුකරනු ඇත.

**ආර්.එම්.ටී.බී. හාතියල්දෙණිය**
**ලේකම්,**
**ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.**

**2016-12-22 වන දින,**
**ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**බදුල්ල.**

# ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි)

## ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2016

A. ඔබ අයදුම්කරන තනතුර හා ශ්‍රේණිය :

B. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :

C. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 1, දෙමළ - 2, ඉංග්‍රීසි - 3

01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : Mr/Mrs/Miss ..................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා : PERERA A.B.C. (Mr/Mrs/Miss මෙහිදී යන වචන අතරින් අදාළ නොවන වචන කපා හරින්න)

1.2 සම්පූර්ණ නම : ..................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම : ..................
(සිංහලෙන් / දෙමළෙන්)

02. 2.1 ස්ථිර ලිපිනය : ..................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය : ..................
(සිංහලෙන් / දෙමළෙන්)

2.3 දුරකථන අංකය : ..................

03 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී - 1 / පුරුෂ - 0

3.2 උපන් දිනය : අවුරුද්ද මාසය දිනය

3.3 2017-01-16 දිනට වයස : අවුරුදු මාස දින

3.4 ජාතික හැඳුනුම්පත් අංකය :

04. 4.1 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවද සිටද? : ..................

4.2 පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ..................

4.3 පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාශය : ..................

05. අධ්‍යාපන සුදුසුකම් :

5.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය :

| | පළමුවර | | | දෙවනවර | |
|---|---|---|---|---|---|
| | **වර්ෂය : ..........................** | | | **වර්ෂය : ..........................** | |
| | **විභාග අංකය : ......................** | | | **විභාග අංකය : ......................** | |
| | **විෂයය** | **සාමාර්ථය** | | **විෂයය** | **සාමාර්ථය** |
| 1 | | | 1 | | |
| 2 | | | 2 | | |
| 3 | | | 3 | | |
| 4 | | | 4 | | |
| 5 | | | 5 | | |
| 6 | | | 6 | | |
| 7 | | | 7 | | |
| 8 | | | 8 | | |

5.1 අ.පො.ස. (උ/පෙළ) විභාගය :
1. වර්ෂය : .................. 2. විභාග අංකය : ..................

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

5.2 වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

| පාඨමාලාවේ නම | ලබාගත් ආයතනය | සහතිකය වලංගු දිනය | හදරා ඇති විෂයයන් |
|---|---|---|---|
| | | | |

6. වෙනත් සුදුසුකම් : ..................
..................
..................
..................
..................

7. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය : ..................
ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..................

**මුදල් ගෙවූ ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න**

8. අයදුම්කරුගේ සහතිකය :
.................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම්කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බවද දනිමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය : .................. ..................
අයදුම්කරුගේ අත්සන

### අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................. ලිපිනයේ පදිංචි .................. මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු / ඇය .................. දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය : .................. ..................
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

සහතික කරන අයගේ සම්පූර්ණ නම : ..................
තනතුර : ..................
ලිපිනය : ..................
..................

### රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

.................. මයා / මිය / මෙනවිය දැනට .................. අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ .................. දින සිට .................. වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහුට / ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සහතික කරන අතර, පත්වීමක් සඳහා ඔහු / ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

දිනය : .................. ..................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම : ..................
තනතුර : ..................
ලිපිනය : ..................
..................